# ඔවුන්ගේ ලෝක ව්‍යාප්ත සංවිධානය සහ වැඩකටයුතු

රටවල් 230කට වඩා වැඩියෙන් සිදු කෙරෙමින් තිබෙන්නාවූ සාක්ෂි දැරීමේ වැඩය මෙහෙයවනු ලැබීමට පුරුක් කිහිපයක් යොදාගැනේ. සමස්ත අධීක්ෂණ කටයුතු මෙහෙයවනු ලබන්නේ නිව් යෝර්ක් නගරයේ බෲක්ලින්හි පිහිටි ජගත් මූලස්ථානයේ පාලක මණ්ඩලය මගිනි. සෑම වසරකම පාලක මණ්ඩලය ලොව වටා විවිධ කලාපවලට නියෝජිතයෙකු යවන අතර, එම කලාපවල සිටින ශාඛා නියෝජිතයන් සමඟ සාකච්ඡා පවත්වනු ලැබේ. ශාඛා කාර්යාලවල ශාඛා කමිටු තිබෙන අතර, එම කමිටුවල සාමාජිකයෝ තුන්දෙනෙක් සිට හත්දෙනෙක් දක්වා සේවය කරති. ඔවුහු තමුන්ගේ ශාඛා බලප්‍රදේශය යටතේ පවතින රටවල වැඩකටයුතු අධීක්ෂණය කරති. ඇතැම් ශාඛාවන්ට මුද්‍රණ පහසුකම් තිබෙන අතර, ඇතැම් ඒවායේ අධිවේගී භ්‍රමණ යන්ත්‍ර මුද්‍රණ කටයුතු සඳහා යොදාගැනේ. ශාඛාවක් මගින් අධීක්ෂණය කරනු ලබන රටක් හෝ ප්‍රදේශයක් දිස්ත්‍රික්කවලට බෙදා වෙන් කෙරෙන අතර, සෑම දිස්ත්‍රික්කයක්ම චාරිකාවලට බෙදා වෙන් කෙරේ. සෑම චාරිකාවක්ම සභා 20කින් පමණ සමන්විතය. දිස්ත්‍රික් අවේක්ෂකයෙක් තමාගේ දිස්ත්‍රික්කයේ චාරිකාවන් කලින් කලට ගොස් බැහැදකී. සෑම චාරිකාවක් සඳහාම වාර්ෂිකව එක්රැස්වීම් දෙකක් පැවැත්වේ. තවද, චාරිකා අවේක්ෂකයෙක්ද සිටී. ඔහු තමාගේ චාරිකාවට අයත් සභාවන් සෑම වසරකම වතා දෙකක් බැහැදකින අතර, එම එක් සභාවකට පවරා ඇති බලප්‍රදේශය තුළ දේශනා වැඩකටයුතු සංවිධානය කිරීම සඳහා එම සභාවට අයත් සාක්ෂිකරුවන්ට සහය වෙයි.

ඔබේ පළාතේ ඇති සභාවක් සහ එහි තිබෙන රාජ්‍ය ශාලාව ඔබේ ප්‍රජාවට ශුභාරංචිය පැවසීමෙහිලා මධ්‍යස්ථානයයි. මේ සෑම සභාවකටම අයත් ප්‍රදේශ කුඩා බලප්‍රදේශවලට බෙදා සිතියම් ගත කර තිබේ. එම කුඩා බලප්‍රදේශවල තිබෙන සෑම නිවසකම වෙසෙන ජනතාව පෞද්ගලිකව බැහැදැක ඔවුන්ට කතා කිරීමට සාක්ෂිකරුවෝ උත්සුක වෙති. සෑම සභාවකම සාක්ෂිකරුවන් ස්වල්පදෙනෙකුගේ සිට උපරිමයෙන් 200ක් පමණ දක්වා සංඛ්‍යාවක් සිටින අතර, විවිධ වැඩකටයුතු ගැන බලා කියා ගැනීමට පත් කරන ලද වැඩිමහල්ලෝ සිටිති. යෙහෝවාගේ සාක්ෂිකරුවන්ගේ සංවිධානයේ අතිවැදගත්ම තැනැත්තා වනුයේ ශුභාරංචිය ප්‍රකාශ කරන පුද්ගලයායි. ජගත් මූලස්ථානයේ හෝ ශාඛාවක හෝ සභාවක සේවය කරන ඕනෑම සාක්ෂිකරුවෙක්, තමන්ගේ ක්ෂේත්‍රයට ගොස් දෙවිගේ රාජ්‍යය ගැන ශුභාරංචිය පෞද්ගලිකව ජනයාට කතා කරයි.

මෙම ක්‍රියාකාරකම්වල වාර්තාවන් අවසානයේදී ජගත් මූලස්ථානයට යැවෙන අතර, අවුරුද්දකට වතාවක් වාර්ෂික පොත සකස් කොට පළ කෙරේ. තවද, සෑම වසරකම මුරටැඹ සඟරාවේ ජනවාරි 1වන දා කලාපයේ වගුවක් පළ කරනු ලැබේ. මෙම ප්‍රකාශන දෙක







තුළ, යෙහෝවා ගැන සහ ක්‍රිස්තුස් යේසුස් යටතේ තිබෙන ඔහුගේ රාජ්‍යය ගැන සාක්ෂි දැරීම පිළිබඳව වාර්තාවක් සෑම වසරකම ඉදිරිපත් කෙරේ. මෑත වර්ෂවලදී සාක්ෂිකරුවන් සහ උනන්දුමත් පුද්ගලයන් 1,40,00,000ක් යේසුස්ගේ මරණය වාර්ෂික සිහි කිරීමේ උත්සවයට සහභාගි වී ඇත. යෙහෝවාගේ සාක්ෂිකරුවන් වර්ෂයකට පැය 1,00,00,00,000කට වඩා වැඩි ප්‍රමාණයක් ගත කරන අතර, නවකයන් 3,00,000කට වඩා වැඩි දෙනෙක් වාර්ෂිකව බව්තීස්ම වෙති. බෙදා දෙනු ලබන පොත් පත්වල සංඛ්‍යාව පිටපත් මිලියන සිය ගණනක් පමණ වෙයි.

